www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා රාජ්‍යයේ දෙමල විරෝධී යුද්ධයේ ලා වොෂිංටනයේ සාපරාධී භූමිකාව

## Washington’s criminal role in the Sri Lankan state’s anti-Tamil war

**2009 ජනවාරි 12**

ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ “සාම ක්‍රියාවලිය” අත හැර දැමීම වොෂිංටනය දිවයිනේ ජනවාර්ගික යුද්ධයේ උසිගන්වන්නා ද ආධාර කරුවා ද වශයෙන් ඉටුකරන සාපරාධී භූමිකාව විදහා දක්වයි.

ශ්‍රී ලංකාවේ රාජ්‍යය මෑත දී අත් කරගත් මිලිටරි ජයග්‍රහන පසුගිය බදාදා සාදරයෙන් පිලිගත් කොලඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය එල්ටීටීඊය සමූල ඝාතනය කර දැමීම කරා ඉදිරියට යන ලෙස ලංකාවේ ආන්ඩුවට සහ මිලිටරියට ධෛර්ය දුන්නේ ය. එම ප්‍රකාශයේ තීරනාත්මක ඡේදය මෙසේ කියා සිටියේ යඃ “1997 පටන් එල්ටීටීඊ සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස තහනම් කර ඇති ඇමරිකා එක්සත් ජනපදය එල්ටීටීඊය සමග සාකච්ඡා කල යුතු යයි ශ්‍රී ලංකාවට කියා සිටින්නේ නැත.”

25 වසරක සිවිල් යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් උවමනා නැතැයි වොෂින්ටනය නිල වශයෙන් ප්‍රකාශ කර පැය ගනනාවක් ඇතුලත ශ්‍රී ලංකාවේ ආන්ඩුව එල්ටීටීඊය තහනම් කර දැමීය. එල්ටීටීඊ සංවිධානයට “සහයෝගය” දෙන්නේ යයි චෝදනා කරනු ලබන පුද්ගලයන් අවුරුදු 20ක් දක්වා සිරගත කිරීමේ බලය ශ්‍රී ලංකා රාජ්‍යය දැන් සිය’තට ගෙන ඇත. එල්ටීටීඊ සංවිධානයට එරෙහි යුද්ධමය ප්‍රහාරය 2006 දී යලි ආරම්භ කලායින් පසුව ආන්ඩුව හා මිලිටරිය මෙම චෝදනාව තථ්‍යසමව ආන්ඩුවේ යුද්ධයට පමනක් නොව, එහි සමාජ ආර්ථික පිලිවෙත්වලට ද විරුද්ධවන්නන්ට එරෙහිව නිරතුරුව දමා ගසන ලදී. මෙම චෝදනාවට ඉලක්කව සිටින්නන් අතර සමාජවාදීන් හා වැඩ වර්ජක කම්කරුවන් පමනක් නොව එල්ටීටීඊ සංවිධානය වනාහී ආන්ඩුව සමග සාකච්ඡා කිරීම සඳහා දෙමල ජනයාට සිටින එකම නීතියුක්ත නියෝජිතයා ය යන්න අවධාරනය කරන, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීන් 20ක නියෝජිතයන්ගෙන් යුත් ටීඑන්ඒ සංවිධානය ද වේ.

කලින් එල්ටීටීඊ සංවිධානය නීති විරෝධී යයි තහනම් කර සිටි කොලඹ ආන්ඩුව සටන් විරාමයක් ප්‍රකාශ කොට 2002 දී එල්ටීටීඊය සමග සාකච්ඡා ඇරඹූ අවස්ථාවේ දී එම තීන්දුව වෙනස් කලේ ය.

එක්සත් ජනපදය සාම ක්‍රියාවලිය අතහැර දැමීමත් සමග ම ශ්‍රී ලංකාවේ ආන්ඩුව එල්ටීටීඊය තහනම් කිරීම නිරූපනය කරන්නේ ශ්‍රී ලංකාවේ සිංහල ධනේශ්වර ප්‍රභූව විසින් දියත් කරනු ලැබ ඇති ජනවාර්ගික යුද්ධය තුල - උසිගන්වන්නා ද සහකරුවා ද ලෙස - වොෂිංටනය ඉටු කරන්නාවූ සාපරාධී භූමිකාව යි.

2006 දී සිවිල් යුද්ධය යලි දියත් කිරීමට කොලඹ පාලන තන්ත්‍රයට දිරි දුන් වොෂිංටනය, ශ්‍රී ලංකා මිලිටරි ලේවැකි ප්‍රහාරයේ සෑම පියවරයකට ම ආධාර උපකාර දී තිබේ. ශ්‍රී ලංකාවේ මිලිටරිය දැන් අලුතින් පෙන්වන හපන්කම්වලට මුලුමනින් ම හේතුවී ඇත්තේ වොෂින්ටනයෙන් ද ප්‍රධාන පෙලේ එක්සත් ජනපද සගයන්ගෙන් ද එය ලබන ඍජු සහයෝගයයි.

සන්නද්ධ ජන නැගිටීම්වලට එරෙහි විශේෂ පුහුනුව ද ඔත්තු සේවා ද, ‘මාරක නොවන’ අවි ආයුධ ද ශ්‍රී ලංකා හමුදාවන්ට සම්පාදනය කල බව වොෂිංටනය කෙලින්ම පිලිගනී. වොෂිංටනයේ මෙම ආධාරවලට ඉන්දියාවෙන් හා වෙනත් ස්ථානවලින් ආධාර-උපකරන ලබා ගැනීමට එල්ටීටීඊය යොදාගත් මාර්ග බිඳ දැමීම සඳහා කොලඹ පාලනයට ලබා දුන් සූක්ෂම මුහුදු රේඩාර් උපකරන ද ඇතුලත් ය. වොෂිංටනයේ සමීප සහකරුවන් ලෙස ක්‍රියාකරන යුද හමුදා සහිත ඊස්රායලය හා පකිස්ථානය ශ්‍රී ලංකාවේ හමුදාවට වඩාත් පුලුල් වූ ද තාක්ෂනිකව-දියුනු කරන ලද්දා වූ ද ආයුධ තොග පවරා දී තිබේ.

කැනඩාව ද යුරෝපීය සංගමය ද වෙනත් රටවල් ද ලවා එල්ටීටීඊය තහනම් කරවීමට (1997 දී ම එල්ටීටීඊය තහනම් කල) ඇමරිකා එක්සත් ජනපදය කල බලපෑම තීරනාත්මක හේතුවක් විය. මෙම තහංචි නිසා සිදු වූ දෙය නම් - ලංකාවේ සිවිල් යුද්ධය විසින් තම නිවහන්වලින් පලවා හරිනු ලැබ විදේශගතවී සිටින ලක්ෂ ගනන් විදේශගත දෙමල ජනයාගේ මුදල්මය ආධාර ලබා ගැනීමට නොහැකි තත්වයක් උද්ගත වීමය.

2006 ජනවාරි මාසයේ දී - කොලඹ වත්මන් ආන්ඩුව බලයට පැමින, කලින් දෙමල ජනයාට දෙන ලද සහන ‘ලිහිල් වැඩි’ යයි හෙලා දුටු වහාම එක්සත් ජනපද තානාපති, ජෙෆ්රි ලුන්ස්ටඩ්, එල්ටීටීඊය කොලඹ පාලනය සමග සම්මුතිකට එලඹීමට ඉක්මනින් එකඟ

නුවූයේ නම් එල්ටීටීඊයට සිදුවනු ඇත්තේ, "වඩාත් ශක්තිමත්, වඩාත් ඉහල පුහුනුවක් ලත් වඩාත් අධිෂ්ඨාන සහගත ශ්‍රී ලංකා හමුදාවකට" මුහුන දීමට යයි අනතුරු හැඟැවී ය.

මෙම කරුන නිසැකවම පැහැදිලි කිරීම සඳහා ලුන්ස්ටඩ් මෙසේ ද කීය: "අපගේ මිලිටරි ආධාර සහ පුහුනු කිරීම වැඩ පිලිවෙල මගින් අපි ශ්‍රී ලංකාවේ ආන්ඩුවට සිය මහජනතාව ද ආසක්තයන් ද ආරක්ෂා කර ගැනීමේ හැකියාව දියුනු කර ගැනීමට උදව් කරමින් සිටිමු."

මෙම ආධාරය වෙනුවෙන් කොලඹ පාලනය ඇමරිකාවට දෙන ලද පිදවිල්ල වනාහී (ඇමරිකාවට සිය යුද සැලසුම් සඳහා ලංකාවේ භූමිය පාවිච්චි කිරීමට ඉඩ දෙන) ක්‍රොස්-සර්විසිං ගිවිසුම යි.

පසුගිය සතියේ එක්සත් ජනපද තානාපති ප්‍රකාශයෙන් සිංහල ප්‍රභූ සංස්ථාපිතය සමග එක්වූ වොෂිංටනය, කිලිනොච්චිය ''මුදාගැනීම'' ඔසොවා දැක්වී ය. කිලිනොච්චිය වනාහී දිවයිනේ උතුරේ හා නැගෙනහිරේ ප්‍රදේශවල පැවැති එල්ටීටීඊ-පාලිත වැයික්කියේ අග නුවර ලෙස යොදාගෙන තිබුනු නගරයයි. යථාර්ථය නම් ඉවක්බවක් නැතිව ගුවනින් බෝම්බ හෙලීම ද කාලතුවක්කු ප්‍රහාරයන් ද පෙරටු කර ගත් ප්‍රහාරයක් මෙම නගරයට එරෙහිව ශ්‍රී ලංකා හමුදාවන් විසින් එල්ල කරන ලද බවයි.

උතුරු පලාතේ පමනක් දැනට 300,000ක් පමන උන්හිටි තැන් නැතිව අනාථ භාවයට ඇද දමනු ලැබ තිබේ. මෙයින් බොහෝ දෙනෙක් දැනට ම සාගතයේ හා රෝගවල තර්ජනයට ලක්ව සිටිති. ඊට හේතුව නම් ශ්‍රී ලංකා ආන්ඩුව තම මිලිටරි ප්‍රහාරයන් සමගම, සැප්තැම්බර් මාසයේ දී එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලින් සියලු සහන-සංවිධාන නියෝජිතයන්ට ප්‍රදේශයෙන් ඉවත් වීමට නියම කොට මූලික සහන සම්පාදනය ක්‍රමානුකූලව හිර කොට දමා ඇති හෙයිනි. එල්ටීටීඊ සංවිධානයට විරුද්ධ වූ සංවිධානයක් වන හියුමන් රයිට්ස් වොච් සංවිධානය ශ්‍රී ලංකාවේ අධිකාරීන් මාස 10කට පෙර වන්නි මෙහෙයුම ඇරැඹීමෙන් පසු තමන් විසින් ''විමුක්ත කරගනු'' ලැබීයයි කියා සිටින දෙමල ජනයා ''සියල්ලන්ම පාහේ'' අද වනතෙක්ම සිරකඳවුරුවල අත් අඩංගුවේ තබා ගෙන සිටින බව පෙන්නුම් කර දී තිබේ.

ඊස්රායල් ආන්ඩුව ගාසා තීරයේ අරඹා ඇති ප්‍රහාරයේ දී මෙන්, වොෂිංටනය ද බටහිර මාධ්‍ය ද ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ ඉතිහාසය ක්‍රමානුකූලව විකෘත කරමින් පීඩනයට ලක් වූවන් ආක්‍රමනිකයන් හා ත්‍රස්තවාදීන් යයි හෙලා දකින අතර මහජනතාව පාගා දැමීමට සමත් වීමට එල්ල වූ රාජ්‍ය ත්‍රස්තවාදයට නරුම ලෙස අවසර දී, සත්තකින් ම උත්කර්ෂයට නංවමින් වැඩට බැස ගෙන සිටිති.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය සිංහල ධනපති පන්තිය විසින් දශක හයකට අධික කාලයක් තුල දිවයිනේ දෙමල සුලුතරය එන්න-එන්නම උග්‍ර ලෙස මර්දනයට ලක්කිරීමේ ප්‍රතිඵලය බව ද එකකට පසුව එකක් වශයෙන් විවිධ ආන්ඩු විසින් මෙම යුද්ධය කරගෙන යන ලද්දේ සිංහල බල ප්‍රභූවේ බලය හා වරප්‍රසාද මුල් බස්සා තහවුරු කිරීමට යයි ද වටහා ගැනීම වනාහී සුලුධනපති එල්ටීටීඊයේ ජාතිකවාදී දේශපාලනයට යුක්ති සම්පාදනය කිරීමක් නොවේ.

විජිතවාදය ද, දිගින් දිගට ම පවත්වාගෙන යනු ලබන අධිරාජ්‍යවාදී ආධිපත්‍යය ද යන මේ දෙකේම උරුමයට කුමන හෝ ප්‍රගතිශීලී විසඳුමක් සම්පාදනය කිරීමට අසමත් වූ සිංහල ධනේශ්වරය කම්කරු පන්තිය බෙදා තම පාලනයට සමාජ පදනමක් නිර්මානය කර ගැනීම සඳහා දෙමල විරෝධී ජාත්‍යොත්තමවාදය අවුලුවා ඇත.

1948 ස්වාධීනත්වය අවස්ථාවේ දී, සිංහල ධනපති පන්තිය, ලංකාවේ කම්කරු පන්තියේ විශාලතම හා සටන්කාමී ම කොටස වන දෙමල කථා කරන වතු කම්කරුවන්ගේ පුරවැසි අයිතිවාසිකම් අහෝසි කලේ ය. ඉන් අවුරුදු 10ක් ගතවීමට ද පෙර සිංහල එකම රාජ්‍ය භාෂාව යයි ප්‍රකාශයට පත් කරන ලදී. 1970 ගනන්වල බුද්ධාගම රාජ්‍ය ආගම යයි ප්‍රකාශයට පත් කරන ලදී. - දෙමල කතා කරන ජනයා අයත් වන්නේ හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් යන ආගම්වලට ය. විශ්වවිද්‍යාලවලට ඇතුලු වීම සඳහා දෙමල අයට සීමා පනවන ලදී. ආන්ඩුව විවෘත ආර්ථික නව-ලිබරල් මාවතකට හැරීමට අභියෝග කල 1980 මහා වැඩ වර්ජනය තලා දමා වසර 3ක් ගතවීමත් සමග 1983 දී ශ්‍රී ලංකාවේ ආන්ඩුව දෙමල සුලුතරයට එරෙහි ජන සංහාර සංවිධානය කලේ ය. එසේ ම, 2006 දී සිවිල් යුද්ධය යලි අවුලුවාලීමට ආරම්භකත්වය ගත්තේ ද ශ්‍රී ලංකාවේ රාජ්‍යයයි. වොෂිංටනයේ ආධාරයෙන් අටවා ගත් ඊනියා සාම ක්‍රියාවලිය ශ්‍රී ලංකා ආන්ඩුව විසින් ප්‍රයෝජනයට ගනු ලැබුවේ තමන් අතට අලුත් ආයුධ ලබාගෙන සන්නද්ධවීමට ය. සිංහල සංස්ථාපිතයේ මානසික තත්වය පසුගිය සැප්තැම්බරයේ කැනේඩියානු පුවත්පතකට යුද හමුදා අන දෙන නිලධාරී ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා මෙසේ පැහැදිලි කලේ ය. ''මේ රට සිංහලයන්ට අයිති යයි මම තදින්ම විශ්වාස කරමි. රටේ බහුතරය වන අපි, සියයට 75ක් වන අපි කවර කලෙකවත් යටත් නොවන්නෙමු. මේ රට ආරක්ෂා කර ගැනීමට අයිතියක් අපට තිබේ. ඔවුන්ට (සුලුතරයට) අප සමග මේ රටේ ජීවත් වීමට ඉඩ ඇත. එහෙත් සුලුතරයක්ය යන ව්‍යාජ හේතුව යොදා ගෙන ඔවුන්ට අයිති නැති දේවල් ඉල්ලීමට ඉඩ දිය නොහැකි ය.''

කුමන මිම්මකින් ගත්ත ද, අවුරුදු 25ක සිවිල් යුද්ධය ශ්‍රී ලංකාවේ ජනතාවට සිංහල දෙමල යන දෙගනයේ ම මිලියන 19ක් පමනක් ජනයා සිටින මේ රටේ 70,000

ක් මරා දමා තිබේ. දෙමළ ජාතිකයන් 800,000ක් රට හැර ගොස් ඇත. තවත් අඩමිලියනයක් පමන රට තුල ම අවතැන්ව සිටිති. මෙහි තේරුම නම් දෙමළ ජනගහනයෙන් තුනෙන් පංගුවක් ම ඔවුන්ගේ උන්හිටිතැන් අහිමිව සිටිනා බවය. යුද්ධයේ විනාශය ද ඒ සඳහා යටකරන ලද මුදල් සම්භාරය ද නිසා රටේ සංවර්ධනය දශක ගනනාවකින් ආපසු ඇද වැටී තිබේ. අද මිලිටරියට වාර්ෂික ජාතික අයවැයෙන් සියයට 17ක් වැයවේ. මහජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද සමාජ සේවාවන් ද එක පිට එක කප්පාදු කිරීම සඳහා යුද්ධය යොදා ගනු ලැබ තිබේ. අතුරුදහන්වීම් ද දේශපාලන ඝාතනයන් ද නිරන්තර දේ බවට පත්ව ඇත. රාජපක්ෂ පවුල ද එහි ගැත්තරයන් ද හමුදාව ද රට ආන්ඩුකරන තතු තුල පාර්ලිමේන්තුව වඩවඩාත් එවන් පාලනයක වහන්තරාව බවට පත්ව ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍යය කිලිනොච්චියේ දී ලද ඊනියා ''ඓතිහාසික'' ජයග්‍රහනය ක්ෂනික ඉක්බිත්තේ ජනාධිපති රාජපක්ෂ මහජනතාව තව තවත් ''කැප කිරීම'' කල යුතු යයි කෙලින්ම ප්‍රකාශ කොට තිබේ. මේ අතර ආන්ඩුව එල්ටීටීඊය මත ද පූර්න තහනමක් පනවා ඇති අතර ප්‍රමුඛ විපක්ෂ පුවත්පතක කතුවරයා ඝාතනය කරනු ලැබ තිබේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍යය විසින් දෙමළ ජනයා මර්දනය කිරීමට එරෙහිව සමූහ ජන ව්‍යාපාරයක් ලෙස පැන නැගි එල්ටීටීඊයට එරෙහිව සමූලඝාතක යුද්ධයකට වොෂිංටනය දෙන සහයෝගය වනාහී එක්සත් ජනපදයේ පාලක ප්‍රභූව මුලුමහත් භූතලය පුරාම යුද්ධය ද ප්‍රතිගාමිත්වය ද වැලඳ ගැනීමේ ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකාවේ ප්‍රතිගාමී රාජ්‍යය ශක්තිමත් කොට දෙමළ ජනයා සහ කම්කරු පන්තිය මැඩලීම දිගින් දිගට ම කර ගෙන යාමට එල්ල වූ වොෂිංටන් හා කොලඹ වැඩපිලිවෙලට ජාත්‍යන්තර කම්කරු පන්තිය විරුද්ධ විය යුතු ය. මෙය කිරීම යනු කිසිසේත් ම එල්ටීටීඊයේ දේශපාලනයට සහයෝගය දීමක් නොවේ. දෙමළ ප්‍රභූවේ අවශ්‍යතා නියෝජනය කරන එල්ටීටීඊය ඉන්දියාවේ, ඇමරිකා එක්සත් ජනපදයේ සහ වෙන මහ බලවතුන්ගේ සහාය ලබාගෙන තමන් සඳහා ධනේශ්වර රාජ්‍යයක් නිර්මානය කර ගැනීමට උත්සාහ දරයි. ලංකාවේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තියට ආයාචනා කිරීමට එල්ටීටීඊය ඓන්ද්‍රීයව ම අසමත් වන්නේ එහි පන්ති ස්වභාවය නිසා ය. එහෙත් යුද්ධය අවසන් කොට ශ්‍රී ලංකාවේ ධනේශ්වර රාජ්‍යය පෙරලා දමා බලය අත්පත් කරගෙන දෙමළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් රැකලීම තමන්ගේ ම පන්ති අවශ්‍යතාවයට අනුකූලවන්නාවූ ද ඊට අදාල සමාජමය බලය දරා සිටින්නාවූ ද එකම බලවේගය වනාහී ජාත්‍යන්තර කම්කරු පන්තියයි.

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සටන් වදින්නේ ඉහත කී ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනයට යි. ශ්‍රී ලංකාවේ පලාත් සභා මැතිවරනයට අපේක්ෂකයන් ඉදිරිපත් කරමින් කල ප්‍රකාශයක සමාජවාදී සමානතා පක්ෂය මෙසේ ප්‍රකාශ කලේ ය. ''අනෙකුත් සියලු දේශපාලන පක්ෂවලට එරෙහිව, සසප අපේක්ෂකයෝ ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව එල්ටීටීඊයට එරෙහිව ගෙනයන යුද්ධයට දැඩි ලෙස විරුද්ධවෙමින් උතුරෙන් හා නැඟෙනහිරෙන් සියලු හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යයි ඉල්ලා සිටිති.

''මෙය ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක් හෝ විමුක්ති යුද්ධයක් නොව, කම්කරු පන්තියේ සිංහල, දෙමළ හා මුස්ලිම් සමස්තයම මත සිංහල පාලක ප්‍රභූවේ වරප්‍රසාද හා බලය පිහිටුවා ගැනීමේ යුද්ධයකි. සසප සියලු කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ, වාර්ගික දේශපාලනයේ විෂසෝර භේදකාරීත්වය තීරනාත්මකව ප්‍රතික්ෂේප කරන ලෙස හා සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත සිය පොදු පන්ති අවශ්‍යතාවන් සඳහා අරගලයක් තුලට ඒකාබද්ධ වන ලෙසයි.''

සසප ප්‍රකාශය තව දුරටත් මෙසේ ද කීය. ''ශ්‍රී ලංකාවේ යුද්ධය අති මූලික ප්‍රජාතන්ත්‍රවාදී හා ජාතික කර්තව්‍යයන් විසඳීමෙහි ලා කලාපය පුරාම ධනේශ්වර පන්තිය දක්වන නොහැකියාව පිලිබඳ වඩාත්ම කැපී පෙනෙන නිදසුනයි. ආගමික, වාර්ගික හා භාෂාමය වෙනස්කම් කම්කරු පන්තිය බෙදීම හා ධනේශ්වර පාලනයට මුක්කු ගසාගැනීම සඳහා දශක ගනනාවක් තිස්සේ උපයෝගී කරගනු ලැබ ඇත්තේ, මිලියන සිය ගනනක් සාමාන්‍ය ජනතාව විනාශයේ හෙලමිනි. මුම්බායි ජනඝාතනය හමුවේ ඉන්දියාව හා පකිස්ථානය යලි වතාවක් යුද බෙර වයමින් සිටියි. වාර්ගික හා ආගමික ජාතිවාදයටත් මිලිටරිවාදයටත් එරෙහිව ආස්ථානයක් ගැනීම මගින් ශ්‍රී ලංකාවේ කම්කරුවන් දකුනු ආසියාවේ කම්කරු පන්තියට ඉදිරි මාවත පෙන්වනු ඇත.''

**කීත් ජෝන්ස්.**

© www.wsws.org